IHP
INSTITUTE FOR HEALTH POLICY

72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය නිවේදනය

**නිකුත් කිරීම**

දිනය: 2024 නොවැම්බර් 22
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව.02.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# ශ්‍රී ලාංකික පාරිභෝගික විශ්වාසය: ඔක්තෝබර් මස දී පාරිභෝගික විශ්වාසය 2022 වසරෙන් පසු වාර්තා වූ ඉහළම අගයට

## *ජනාධිපතිවරණයෙන් පසු ජනමතය අඛණ්ඩව වඩාත් යහපත් අතට හැරෙමින් පැවතුණි*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) එහි ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණ (SLOTS) මඟින් සකසන ලද පාරිභෝගික විශ්වාසනීයත්ව දර්ශකයේ 2024 ඔක්තෝබර් මස යාවත්කාලීනය අද දින නිකුත් කෙරිණි.

ඔක්තෝබර් මස දී IHP ආයතනයේ පාරිභෝගික විශ්වාසනීයත්ව දර්ශක තුනම ඉහළ ගොස් තිබුණු අතර, ඒවා 2022 වසරේ දී SLOTS මත විමසුම් ආරම්භ කළ දා පටන් වාර්තා වූ ඉහළම අගයට එළැඹුණි. පසුගිය මාසය හා සැසඳීමේ දී, මහජනයාගේ පුද්ගලික ආර්ථික තත්ත්වය සහ ජාතික ආර්ථික තත්ත්වය මැනෙන පුළුල් දර්ශකයක් වන පාරිභෝගික හැඟීම් පිළිබඳ දර්ශකය (ICS) ලකුණු 8කින් ඉහළ ගොස්, ලකුණු 40 දක්වා ළඟාවී ඇත. අනාගත ප්‍රවණතා පිළිබඳ නිරීක්ෂණය කරන පාරිභෝගික අපේක්ෂාවන් පිළිබඳව දර්ශකය (ICE) ලකුණු 9කින් වැඩි වී ලකුණු 45 දක්වා ඉහළගොස් ඇති අතර, වර්තමාන තත්ත්වයන් පිළිබඳව අනුබෝධය මනින වත්මන් තත්ත්ව දර්ශකය (ICC) ලකුණු 5කින් වැඩි වී, ලකුණු 33 දක්වා ඉහළ ගොස් ඇත.


ICS හා ICCහි වර්ධනය, පෞද්ගලික ආර්ථිකය සහ රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව ඇති වී තිබෙන කෙටි හා දීර්ඝකාලීන යහපත් අවබෝධයන්හි බලපෑම නිසා සිදුව ඇත. කෙසේ නමුත්, වර්තමාන මිලදී ගැනීමේ තත්ත්වයන් පිළිබඳව වූ මහජන මතයන් සැහෙන තරම් දුරට නොවෙනස්ව පැවතී තිබේ.

සියලුම IHP SLOTS පාරිභෝගික විශ්වාසනීය දර්ශක ශුන්‍යයේ සිට උපරිමය 100 දක්වා පරාසයක පවතින අතර, ශුද්ධ අශුභවාදී මට්ටම 50ට අඩු අගයන් මඟින් පෙන්නුම් කරයි.

මේ ඇස්තමේන්තු සියල්ල 2021 ඔක්තෝබර් 21 සිට 2024 නොවැම්බර් මස 7 දා වන තුරු සිදුකරන ලද සම්මුඛ පරීක්ෂණ 21,234ක් මත පදනම්ව සිදුකර ඇති අතර, ඉන් 761ක් 2024 ඔක්තෝබර් මස සිදුකර තිබේ. දර්ශක

සඳහා වූ නියැදිවල ප්‍රමාණය ප්‍රතිචාර දක්වන්නන් සංඛ්‍යාව මත පදනම්ව වෙනස්ව ඇති අතර, ඒවා ජාතික ජනගහනයට අනුකූල වන පරිදි හරිතකර ඇත.

SLOTS මඟින් දිනපතා මුහුණට මුහුණ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහ අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් ප්‍රතිචාර දැක්වූවන් අතරින් ජාතික වශයෙන් නියෝජනය කළ හැකි ආකාරයේ විශාල නියැදියක් භාවිතා කරමින්, මහජන මතය සහ යහපැවැත්ම පිළිබඳව නිරීක්ෂණය කරයි. මෙම දත්ත බොහෝ විද්‍යාත්මක අධ්‍යයනයන් සඳහා භාවිතා කරයි. ඔබට යම් නිශ්චිත යමක් පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය නම්, info `at' ihp.lk විද්‍යුත් තැපෑලෙන් විමසිය හැකිය.




**වැඩි විස්තර ihp.lk වෙතින් ලබා ගත හැක**

Institute for Health Policy, November 2024, "Consumer confidence rises to highest level in October since 2022". *Available at:* *https://ihp.lk/research-updates/cciupdate202410*

Institute for Health Policy, November 2024, "Sri Lanka Consumer Confidence: Consumer confidence rises to highest level in October since 2022", SLOTS Report #2024-18. *Available at: https://ihp.lk/sites/default/files/research-updates/SLOTSReport202418.pdf*

**පෙර වාර්තාවන් ihp.lk වෙතින් ලබා ගත හැකිය**

Institute for Health Policy, September 2024, "Sri Lanka Consumer Confidence: Consumer confidence dropped marginally in August 2024 in lead up to Presidential Election", SLOTS Report #2024-13. *Available at: https://ihp.lk/sites/default/files/research-updates/SLOTSReport202413.pdf*

Institute for Health Policy, July 2024, "Sri Lanka Consumer Confidence: Consumer confidence increased and reached an all-time high in June 2024", SLOTS Report #2024-09. *Available at: https://ihp.lk/sites/default/files/research-updates/SLOTSReport202409.pdf*

Institute for Health Policy, June 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence marginally changed in May 2024 compared to the previous month”, SLOTS Report #2024-06. *Available at: https://ihp.lk/sites/default/files/research-updates/SLOTSReport202406.pdf*

Institute for Health Policy, April 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence surged to a new peak in March 2024”, SLOTS Report #2024-04. *Available at: https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202404.pdf*

Institute for Health Policy, March 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence improved in February 2024”, SLOTS Report #2024-03. *Available at: https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202403.pdf*

Institute for Health Policy, February 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence continued to decline in January 2024”, SLOTS Report #2024-02. *Available at: https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202402.pdf*

Institute for Health Policy, January 2024, “Sri Lanka Consumer Confidence: Consumer confidence improved marginally in December ’23”, SLOTS Report #2024-01. *Available at: https://ihp.lk/sites/default/files/press-release/SLOTSReport202401.pdf*

Institute for Health Policy, March 2022, “SLOTS Consumer Confidence Survey: Methodology for tracking consumer sentiment in Sri Lanka”, SLOTS Report #2022-01. *Available at:* https://ihp.lk/publications/docs/SLOTSReport202201.pdf

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

මෙම සමීක්ෂණය සැලසුම් කිරීම සහ පැවරීම සඳහා IHP මුළුමනින්ම වගකිව යුතු අතර, එහි පූර්ණ වගකීම දරයි. IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTSහි ප්‍රධාන විමර්ශක වන IHPහි ආචාර්ය රවී රන්නන්-එළිය, හාවඩ් විශ්වවිද්‍යාලයයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර, දශක තුනක් පුරා ලංකාව තුළ හා ලංකාවෙන් පිටත විවිධ මත විමසුම් සමීක්ෂණ සිදුකර තිබේ.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹුව තෝරා ගැනීමකින් බඳවාගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියක්, SLOTS මඟින් සමීක්ෂණයට ලක් කරනු ලබයි. SLOTS මඟින් ප්‍රසිද්ධ චරිතයක් හෝ ආයතනයක් පිළිබඳ හිතකර හෝ අහිතකර මතයක් තිබේදැ යි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීම තුළින් හිතකරත්වය නිරීක්ෂණය කරනු ලබයි: සමස්ත හිතකරත්වය යනු ධනාත්මක (+100) සහ ඍණාත්මක (-100) ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අංශය, පළාත සහ පසුගිය ඡන්ද මනාපය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

IHP විසින් සෞඛ්‍ය සහ සමාජ තත්ත්වයන් සහ රටේ මහජන මතයේ වෙනස්කම් නිරීක්ෂණය කිරීම සඳහා SLOTS සමීක්ෂණය පවත්වනු ලබයි. සමීක්ෂණ මාතෘකා නිර්මාණය, පැවරීම සහ සැලසුම් කිරීම සඳහා IHP මුළුමනින්ම වගකිව යුතු අතර, එහි සම්පූර්ණ වගකීම දරයි. ජාතික ක්ෂේත්‍ර සමීක්ෂණයකින් හෝ අහඹු ලෙස දුරකථන අංක ඇමතීමෙන් ප්‍රතිචාර දක්වන්නන් බඳවා ගැනෙන අතර, IHP කාර්යය මණ්ඩලය විසින් දිනපතා සම්මුඛ පරීක්ෂණ සිදු කරනු ලැබේ. දෙදහස් විසි එක වර්ෂයේ සිට SLOTS ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රාහකයින් පරාසයක් සහාය දක්වා ඇති අතර, ඔවුන් අධ්‍යයනය සැලසුම් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හෝ වාර්තා කිරීමේ දී කිසිදු

කාර්යයභාරයක් ඉටු නොකරයි. නීලන් තිරුචෙල්වම් භාරය, ආසියා පදනම, යුරෝපා කොමිසම, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ඕපන් සොසයටි ෆවුන්ඩේෂන් ආයතනය සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයා ඇත. වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සැපයෙන්නේ වීලුකස් ස්ටිෆ්ටුන්ග් පදනම, අබුඩාබියේ නිව්යෝක් විශ්වවිද්‍යාලයය, USAID සහ IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල විසිනි. තව ද, සමීක්ෂණ සොයාගැනීම් අවශ්‍යයෙන්ම අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධකර ගත හැකි ය.